කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I | කාලය පැය 01

නම : ..........................................................................................

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

❖ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 යන පිළිතුරු වලින් නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01. සන්නිවේදනය වර්ග කිරීමේ පදනම සකස් වන්නේ,
1. භාවිත කරන මාධ්‍ය අනුවය
2. සන්නිවේදන විධි ක්‍රමය අනුවය
3. ග්‍රාහක සංඛ්‍යාව අනුවය
4. සන්නිවේදකයා අනුවය

02. විෂය කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගුරුවරයා පවසා සිටියේ එය අවබෝධ නොවූ ශිෂ්‍යයන් සිටී නම් අත් ඔසවන ලෙසටයි. එහිදී සිසුන් බොහෝ දෙනෙකුට විෂය කරුණු අවබෝධ වී නැතිබව පැහැදිලි විය. එයින් අනාවරණය වන්නේ,
1. ප්‍රතිපෝෂණයයි
2. සංජානනයයි
3. බලපෑමයි
4. විකේතිකරණයයි

03. අකේතකරනය පිළිබඳ මුල් වරට හඳුන්වා දෙන ලද්දේ,
1. විල්බර්ශ්‍රාම් විසිනි
2. හැරල්ඩ් ඩී ලැස්වෙල් විසිනි
3. එඩ්වඩ් ෂැපීර් විසිනි
4. ෂැනන් වීවර් විසිනි

04. සන්නිවේදකයා විසින් නිකුත් කරනු ලබන සංදේශය ග්‍රාහකයා වෙත ගලායාම පාලනය කරනුයේ,
1. බලධාරීන් ය
2. මාධ්‍ය හිමිකරුවන්ය
3. දොරටුපාල වරුන්ය
4. මාධ්‍ය හිමිකරුවන්ය

05. මාධ්‍ය අභිසාරිතාවට ප්‍රධාන හේතුවක් වනුයේ,
1. ජනමාධ්‍යවල අනන්‍යතාව බිඳ වැටීමයි
2. සන්නිවේදන හා තොරතුරු තාක්ෂණයේ වර්ධනයයි
3. පුවත්පත් කියවීමේ ප්‍රමාණය අඩු වීමයි
4. ජංගම දුරකථන භාවිතය ප්‍රබල වීමයි

06. හැම උද්වේෂකර ආරාබියක්ම ප්‍රවෘත්තියකි. ඉහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලද්දේ,
1. පොල්ස් මැසෙනියර් විසිනි
2. චාර්ල්සි ඇන්ඩර්සන් විසිනි
3. මිල්ටන් බ්‍රෂ් විසිනි
4. ෂැනන් විවර් විසිනි

07. මුද්‍රිත නාට්‍යයේ ලක්ෂණයක් නොවන්නේ,
1. සාක්ෂරතාවය අවශ්‍යවීම
2. සවිස්තරාත්මක වීම
3. සජීවී බව
4. සංරක්ෂණය පහසු වීම

08. පංචෙන්ද්‍රයන් මගින් ග්‍රහණය කරගන්න සංදේශ තේරුම් ගැනීම,
1 සහවේදනනායි
2. ප්‍රතිපෝෂණයයි
3. ආකේතිකරණනයයි
3. සංජානනයයි

09. වත්මන් ජනමාධ්‍ය වල නිවේදක නිවේදිකාවන් මිශ්‍ර භාෂා ශෛලියක් භාවිත කිරීම. නිසා ඇති විය හැකි බාධාව වන්නේ,
1. අර්ථ බාධා
2. මාධ්‍ය බාධා
3. පාරිසරික බාධා
4. තාක්ෂණික බාධා

10. උත්තේජන ප්‍රතිචාර ක්‍රියාවලියට වඩාත් අදාළ වන්නේ,
1. ගඳ සුවඳ රස තිත්ත හා ස්පර්ශයයි
2. මුහුණ , කට අත් පා ආදියයි
3. මොළය, ස්නායු. හා ශරීරයයි
4. ඇස , කන නාසය දිව හා ශරීරය

11. ප්‍රවෘත්තියක් රචනා කිරීමේදී මුලපාඨය සඳහා අතුලත් කළයුතු වඩාත් නිවැරදි අනුපිළිවෙල සහිත කාණ්ඩය වන්නේ,
   1. කවුද කවදාද, කෙසේද?
   2. කවුද , කුමක්ද , කවදාද, කොහේද?
   3. කවුද ? කුමක්ද? කොහේද?
   4. කවුද කුමක්ද කොහේද ඇයි

12. සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල් නිර්වචනයේ පවතින දුර්වලතාවක් ලෙස විචාරකයින් දක්වන්නේ
   1. පණිවිඩය පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීමයි
   2. සන්නිවේදකයා පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීම
   3. ග්‍රාහකයා පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීමයි
   2. නාලිකාව පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වීමයි

13. කාලය හා අවකාශය මිලදී ගැනීම මත පදනම් වූ තොරතුරු සන්නිවේදනය,
   1. ප්‍රචාරණයයි 2. ප්‍රවර්ධනයයි 3. මහජන සම්බන්ධතාවයි 4. දැන්වීම්කරණයයි

14. මාධ්‍ය පර්යේෂණ යොදා ගනු ලබන්නේ,
   1. ග්‍රාහක රුචි අරුචිකම් දැන ගැනීමටය
   2. ග්‍රාහක අවශ්‍යතා අනුව මාධ්‍ය නවීකරණය ටය
   3. නාලිකාවේ ව්‍යාප්තිය විමර්ශනය කිරීමට ය
   4. ග්‍රාහක ක්ෂේත්‍රයේ සංයුතිය හඳුනා ගැනීමට ය

   ඉහත ප්‍රකාශ අතුරෙන්
   1. A පමණක් නිවැරදිය
   2. A හා B පමණක් නිවැරදිය
   3. AB හා C පමණක් නිවැරදිය
   4. AB හා CD යන සියල්ලම නිවැරදිය

15. එක්තරා පුවත්පතක ලිපියක අදාළ පුද්ගලයාගේ ඡායාරූපය වෙනුවට වෙනත් කෙනෙකුගේ ඡායාරූපයක් පළ වී තිබුණි. එය පසුව නිවැරදි කිරීමට පුවත්පත කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳව පැමිණිලි කළ හැකි රාජ්‍ය ආයතනය වන්නේ,
   1. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවටයි
   2. රාජ්‍ය මුද්‍රණ සංස්ථාව
   3. රූගුම් පාලක මධ්‍යස්ථානයයි
   4. රාජ්‍ය පුවත්පත් මණ්ඩලය

16. ලෝක ඉතිහාසයේ ප්‍රථම ප්‍රක්ෂේපණ යන්ත්‍රය ලෙස හැඳින්වෙන "මැජික් ලන්තෑරුම" නිර්මාණය කරන ලදැයි සැලකෙන්නේ,
   1. ඇතනේසියස් ක්රේචර් විසිනි
   2. පැන්තස් මැගෝරියා විසිනි
   3. ඩැගියුරේ විසිනි
   4. ව්ලැඩිමීර් ස්වෛරිකින් විසිනි

17. දෘෂ්ටියේ අඛණ්ඩත්වයට අයත් නොවන අවස්ථාවකි,
   1. විදුලි පංකාවක් ක්‍රියාත්මක වීම
   2. ගිණිබෝල කර කැවීම
   3. ඔරලෝසුවක කටු කර කැවීම
   4. වාසනා චක්‍රය කර කැවීම

18. ශ්‍රී ලංකාවේ ප්‍රථම ප්‍රාදේශීය ගුවන් විදුලි සේවය වන්නේ,
   1. මහනුවර සේවයයි 2. රජරට සේවයයි 3. රුහුණු සේවයයි 4. කඳුරට සේවයයි

19. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ප්‍රජා ගුවන් විදුලිය වන්නේ,
   1. මහවැලි ප්‍රජා ගුවන් විදුලිය
   2. කොත්මලේ ප්‍රජා ගුවන් විදුලිය
   3. ඌව ප්‍රජා ගුවන් විදුලිය
   4. ගිරාදුරු කෝට්ටේ ප්‍රජා ගුවන් විදුලිය

20. පුවත්පතක රිද්මය හඳුනාගත හැක්කේ,
   1. ප්‍රවෘත්ති මගිනි 2. සංස්කාරක වැකියෙනි 3. කාටූන් චිත්‍රයෙනි 4. තීරු ලිපියෙනි

21. නූතන සන්නිවේදනයේ ප්‍රාරම්භකයා ලෙස සැලකෙන්නේ,
   1. ගුග්ලි එල්මෝ මාර්කෝනියා
   2. ට්සායි ලූං ය
   3. ජොහැන්නස් ගුටෙන් බර්ග් ය
   4. ජෝන් ලොගී බෙයාඩ් ය

22. ප්‍රවෘත්තියක විශ්වාසනීයත්වය ගොඩ නැගෙන්නට අදාළ වනුයේ
   1. වේගවත් බව, ආකර්ෂණීය බව, පැහැදිලි බව
   2. වේගවත් බව, සමතුලිත බව, නිවැරදි බව
   3. නිර්මාණශීලි බව, නිවැරදි බව, පැහැදිලි බව
   4. නිවැරදි බව, සමතුලිත බව, පැහැදිලි බව

23. තොරතුරු රැස්කිරීමේ ශිල්පීය ක්‍රමයක් නොවන්නේ,

1. සම්මුඛ සාකච්ඡා 2. ගවේෂණය 3. බුද්ධි කලම්බනය 4. ප්‍රශ්නාවලිය

24. මීතොට මුල්ල කුණු කන්ද නායයාම නිසා ඇති වූ හදිසි ආපදා තත්ත්වය පිළිබඳ ප්‍රවෘත්තිය අයත් වන්නේ,

1. මෘදු පුවත් ගණයටය 2. දෘඪ පුවතක් ලෙසයි
3. දේශපාලනික පුවත් ලෙසයි 4. ආපදා පුවත් ලෙසයි

25. කිසියම් මාධ්‍යයක ලක්ෂණ පහත දක්වේ

A සාක්ෂරතාවය අවශ්‍ය නොවේ
B පරිකල්පනය දියුණු කරයි
C පිරිවැය අධික වීම
D හුගෝලීය බාධා විරල වීම

ඉහත ලක්ෂණ අතුරින් ගුවන්විදුලි මාධ්‍යයට අදාළ ලක්ෂණ වන්නේ,

1. A හා B පමණි 2. B හා C පමණි
3. A හා B හා D පමණ 4. A හා B,C හා D පමණි

26. පුවත්පතක ප්‍රධාන සංස්කාරක භූමිකාව හා නොගැළපෙන ප්‍රකාශය තෝරන්න.

1. ප්‍රවෘත්ති වාර්තාකරණයේ නියැලීම 2. කතු වැකිය රචනා කිරීම
3. ප්‍රවෘත්ති සංස්කාරකට උපදෙස් දීම 4. මුල් පිටුවේ ප්‍රධාන ඡායාරූපය තේරීම

27. පුවත්පත් මුද්‍රණය සඳහා වර්තමානයේ බහුලවම යොදාගනු ලබන මුද්‍රණ ක්‍රමය වන්නේ,

1. උත්තල මුද්‍රණයයි 2. සමතල මුද්‍රණයයි 3. අංකිත මුද්‍රණයයි 4. ලිතෝ මුද්‍රණයයි

28. රූපයේ චලනමය ලක්ෂණ නිරූපණය කිරීමට මානවයා දැරූ උත්සාහය මුලින්ම ප්‍රකාශ වන්නේ,

1. මැජික් ලන්තෑරුමෙනි 2. සෙවණැලි නාටක මඟිනි
3. පුරාණ ලෙන් චිත්‍ර මඟිනි 4. කැමරා තුවක්කුවෙනි

29. නිශ්චල ඡායාරූප ගැනීම සඳහා භාවිත කරන කැමරාවක අත්‍යවශ්‍ය අංග වන්නේ,

1. ආලෝක ලාම්පුව, මානනය, නාභිගත කිරීම හා පිරිසැකසුම් කිරීම.
2. කාචවිවරය, ආලෝක ලාම්පුව, කැමරා ද්වාර වේගය හා සුදුසු පටලය තෝරා ගැනීම
3. ආලෝක ලාම්පුව, මානනය හා කැමරා ද්වාරය
4. කාචවිවරය හා මානනය හා නාභිගත කිරීමයි

30. තීරණ ගැනීම හා සම්බන්ධ වන්නේ,

1. පුද්ගලාන්තර සන්නිවේදනයයි 2. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයයි
3. සමූහ සන්නිවේදනයයි 4. වාචික සන්නිවේදනයයි

31. සේවක කමිටු, රැස්වීම් , යෝජනා පෙට්ටි, සාකච්ඡා ආදිය අයත් වන්නේ,

1. ඉහළ සිට පහළට ක්‍රියාත්මක වන විධිමත් සන්නිවේදනයයි
2. පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන අවධිමත් සන්නිවේදනයයි
3. හරස් ලෙස ක්‍රියාත්මක වන විධිමත් සන්නිවේදනයයි
4. පහළ සිට ඉහළට ක්‍රියාත්මක වන විධිමත් සන්නිවේදනයයි

32. ඡායාරූපයක වස්තුව පැහැදිලිව තිබියදී පසුබිම අපැහැදිලි කිරීමට අවශ්‍ය වී තිබේ. ඒ සඳහා කළ යුත්තේ,

1. ද්වාර වේගය අඩු කළ යුතුයි 2. නාභිදුර වැඩිකළ යුතුය
3. කාචවිවරය වැඩිකළ යුතුය 4. වස්තු දුර අඩු කළ යුතුය

33. පුවත්පත් ඡායාරූප පිළිබඳව සිසුන් කීපදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ කීපයක් පහත දක්වේ.

A ප්‍රවෘත්තියේ සත්‍ය අවශ්‍යතාව දැන ගැනීමට හැකිවීම

B සාක්ෂරතාවය නොමැති අයට ප්‍රවෘත්තිය අවබෝධ වීමට පහසුය

C පුවත්පතෙහි ආකර්ෂණය වැඩිවේ

ඉහත ප්‍රකාශ අතුරින්

1. A පමණක් නිවැරදිය
2. B හා C පමණක් නිවැරදිය
3. A හා C පමණක් නිවැරදිය
4. A,B හා C සියල්ලම නිවැරදිය

34. දිනපතා පුවත්පත පළ වූ ප්‍රවෘත්ති කීපයක් පහත දක්වේ.

A මී තොට මුල්ල කුණු කන්ද නාය යාමෙන් බොහෝ දෙනෙකුට ජීවිත අහිමි වේ

B ලොව පුරා මුස්ලිම් බැතිමතුන් රාමසාන් සමරති

C ස්පතස්වර සංගීත ප්‍රසංගය නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්වේ

D අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය රැසක මිල ඉහළ යයි

එම ප්‍රවෘත්ති අනුපිළිවෙලින් දෘඪ (Hard) හා මෘදු (soft)පුවත් ලෙස නිවැරදිව වර්ග කර ඇති පිළිතුර වන්නේ,

1. දෘඪ, මෘදු, දෘඪ, මෘදු
2. දෘඪ, දෘඪ, මෘදු, මෘදු
3. දෘඪ, මෘදු, මෘදු, දෘඪ
4. මෘදු, දෘඪ, මෘදු, දෘඪ

35. ස්වයංවාරණය යනු,

1. සංස්කාරක මඟින් සිදු කරන වාරණයකි
2. පොදු සම්මුතීන් සලකා තොරතුරු වාරණය කිරීමයි
3. රජය මඟින් වාරණය කිරීමයි
4. ආචාර ධර්ම මත පිහිටා බලධාරියා මඟින් සිදුකරන වාරණයයි

36. පුවත්පත් වාර්තාවක්, මුද්‍රණයට යොමු කිරීමට පෙර එහි අත්පිටපත සමඟ සැසඳීමේ ක්‍රියාවලිය හඳුන්වන්නේ,

1. සෝදුපත් බැලීම යනුවෙනි
2. පිටපත අනුමත කිරීම යනුවෙනි
3. සංස්කරණය යනුවෙනි
4. අත්පිටපත සැකසීම යනුවෙනි

37. කොළඹින් දුර බැහැර ප්‍රදේශයක ප්‍රාදේශීය වාර්තාකරුවකු ලෙස කටයුතු කරන්නෙකුට නව ප්‍රවෘත්ති හා ඊට අදාල ඡායාරූප ආදිය ඉතා ඉක්මනින් පුවත්පත් කාර්යාලය වෙත ලබාදීමට අනුගමනය කළ යුතු පහසුව ක්‍රමවේදය කුමක්ද?

1. කුරියර් සේවයයි
2. ෆැක්ස් කිරීමයි
3. විද්‍යුත් තැපැල භාවිත කිරීමයි
4. තමාම ගොස් භාර දීමයි

38. ප්‍රදේශ කීපයක සිදු වූ ගංවතුර අනතුරු පිළිබඳව වාර්තා වැඩසටහනක් රූපවාහිනී ප්‍රවෘත්ති ප්‍රකාශකයෙන් ඉදිරිපත් විය. ඊට දායක වූ වෘත්තිකයන්ගේ අනුපිළිවෙල වන්නේ,

1. රූපවාහිනී අධ්‍යක්ෂ, ප්‍රවෘත්ති සංස්කාරක , කැමරා ශිල්පී නිවේදක
2. ප්‍රාදේශීය වාර්තාකරු, ප්‍රවෘත්ති සංස්කාරක, සංස්කරණ ශිල්පී නිවේදක
3. ඡායාරූප ශිල්පී , ප්‍රවෘත්ති සංස්කාරක, අවධ්‍යක්ෂ නිවේදක
4. නිවේදක , ප්‍රවෘත්ති සංස්කාරක, අධ්‍යක්ෂ, කැමරා ශිල්පී

39. පහත දක්වෙන්න් සන්නිවේදන අවස්ථා කිහිපයකි

A නිමල් සිය මිතුරන් සමඟ එක්ව මෙතෙක් ඉගෙනගත් පාඩම් පිළිබඳව සාකච්ඡා කරයි

B විමල් තම හිතවතෙකු සමඟ දුරකථන සංවාදයක යෙදෙයි

C රනිල් තම ප්‍රියතම ගීතය රස විඳිමින් සිටියි

ඉහත අවස්ථා පිළිවෙලින් නියෝජනය කරන සන්නිවේදන වර්ග ඇතුළත් පිළිතුර වන්නේ,

1. අන්තර් පුද්ගල සන්නිවේදනය, අන්තර්වර්තී, සන්දේශය, ජන සන්නිවේදනය
2. ලිඛිත සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, අනතර් වර්තී
3. අන්තර්වර්තී සන්නිවේදනය, සමූහ සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය
4. සමූහ සන්නිවේදනය, අන්තර් පුද්ගල සන්නිවේදනය, අන්තර්වර්තී සන්නිවේදනය

40. ප්‍රදේශය පුරා පැතිර යන ඩෙංගු රෝගය මර්දනය කිරීම පිණිස ප්‍රජාවගේ වැඩි අවධානයක් ලබා ගැනීම සඳහා භාවිත කළ යුතු සුදුසුම ක්‍රමවේදය වන්නේ,

1. රූපවාහිනී දැන්වීම් සකස් කිරීමයි
2. ශබ්ද විකාශන යන්ත්‍ර මඟින් ප්‍රචාරණයක් සිදු කිරීමයි
3. පුවත්පතක පළ කිරීමයි
4. පෝස්ටර් මාධ්‍ය යොදා ගැනීමයි

කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

11 ශ්‍රේණිය | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II | කාලය පැය 02

නම : ..........................................................................................

සැලකිය යුතුයි

- ❖ පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- ❖ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් ද හිමි වේ.

---

01. විද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ හා ගුරු භවතුන්ගේ ලිපි , නිසඳැස් ආදී නිර්මාණ ඇතුළත් ත්‍රෛමාසික සඟරාවක් ප්‍රකාශයට පත් කිරීමට මාධ්‍ය ඒකකයේ සියලු දෙනා අතර සාකච්ඡාවක් පැවැත්විණි. එහි ප්‍රධාන වගකීම පැවරුණේ කමල්ටය.

1. ඉහත සාකච්ඡාවේදී ක්‍රියාත්මක සන්නිවේදන වර්ගය කුමක්ද?
2. ලිපි, නිසඳැස් ආදී නිර්මාණ අයත් වන්නේ කුමන සන්නිවේදන ස්වරූපයට ද?
3. සඟරාව මුද්‍රණය කිරීම සඳහා වඩාත් සුදුසු මුද්‍රණ ක්‍රමය කුමක්ද?
4. එම සඟරාවට විද්‍යාලයේ විවිධ අවස්ථා ඇතුළත් ඡායාරූප ඇතුළත් කිරීමේ වාසි 2ක් දක්වන්න.
5. සඟරාව සම්බන්ධයෙන් කමල්ගේ කාර්යභාරයන් 2ක් දක්වන්න.
6. මෙම කටයුත්ත පහසු කර ගැනීමට යොදාගත යුතු කාර්යාලීය උපකරණය කුමක්ද?
7. සඟරාවේ අකුරු සංයෝජනයට පෙර කළ යුත්තේ කුමක්ද?
8. සඟරාව ප්‍රකාශයට පත් කිරීමට පෙර පරීක්ෂා කර බැලූ විදුහල්පති තුමා නීතිමය ගැටලු මතුවිය හැකි හා විද්‍යාලයේ කීර්තිනාමයට බලපෑ හැකි ඇතැම් කරුණු සංස්කරණය කිරීම කුමන සංකල්පයක් ලෙස හැඳින්වේද?
9. සඟරා මාධ්‍යයේ ලක්ෂණ 2ක් නම් කරන්න.
10. සඟරාවේ පිටපතක් "අන්තර් ජාලයට" එක් කිරීම සුදුසු යැයි කමල් යෝජනා කළේය. එහි ප්‍රයෝජනයක් නම් කරන්න. (ලකුණු 20 යි)

02. විද්‍යාලීය පාසල් දිනයට සමගාමීව එක්දින ගුවන්විදුලි සේවාවක් ක්‍රියාත්මක කිරීමට මාධ්‍ය ඒකකය භාර ගුරුතුමා යෝජනා කළේය.

1. ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි විකාශනයේ නිර්මාතෘවරයා කවරෙක්ද?
2. ගුවන් විදුලි මාධ්‍යයේ ලක්ෂණ 2ක් කෙටියෙන් විස්තර කරන්න
3. ගුවන් විදුලි වැඩසටහන් ප්‍රභේද 3ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න.
4. මෙම මාධ්‍යයේදී මතුවිය හැකි බාධා වර්ග 2ක් නම්කර උදාහරණ සහිතව විස්තර කරන්න.

03. පාසල් කාලයේ හොඳම මිතුරන් වූ රනිල් හා කමල් කලකට පසුව අහඹු ලෙස මහමඟදී මුණ ගැසී කතා කරන්නට වූහ.

1. ඉහත අවස්ථාවේදී ක්‍රියාත්මක සන්නිවේදන වර්ගය කුමක්ද?
2. එහි ලක්ෂණ දෙකක් විස්තර කරන්න.
3. ඔවුන් දෙදෙනා අතර භාවිත විය හැකි නිර්වාචික සන්නිවේදන විධික්‍රම 3ක් විස්තර කරන්න.
4. දිගින් දිගටම සන්නිවේදනයේ යෙදීමට ඔවුන්ට භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම 4ක් විස්තර කරන්න.

04. ජනමාධ්‍ය භාවිතය වත්මන් පුද්ගලයාගේ දෛනික ජීවිතයේ අනිවාර්ය අංගයකි

1. පුවත්පත වූ රූපවාහිනිය හා ගුවන් විදුලිය යන ජනමාධ්‍ය අදාළ ග්‍රාහකයා නම් කරන්න
2. ජනමාධ්‍ය දන්වීම් ග්‍රාහකයාට වැදගත් වන ආකාර 2ක් විස්තර කරන්න
3. ජනමාධ්‍ය හිමිකාරීත්වයේ ප්‍රධාන වර්ග දෙක දක්වා ඒ එක් එක් වර්ගයට අයත්වන ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි හා රූපවාහිනී නාලිකා දෙක බැගින් නම් කරන්න.
4. රූපවාහිනී වැඩසටහන් ප්‍රභේද 2ක් නම් කර ඒවා ළමා මනසට බලපාන ආකාරය පෙන්වා දෙන්න.

05.
1. මාධ්‍ය වේදියෙකු තුළ තිබිය යුතු ගුණාංග 2ක් නම් කරන්න
2. තොරතුරු රැස් කිරීමට අනුගමනය කළ හැකි ක්‍රම 2ක් විස්තර කරන්න.
3. ප්‍රවෘත්ති වාර්තා කරණයේදී යොදා ගන්නා යටිකුරු පිරමිඩ ආකෘතිය ඇඳ එහි ප්‍රයෝජන දක්වන්න.
4. ප්‍රවෘත්තියක වටිනාකම කෙරෙහි බලපාන සාධක 4ක් කෙටියෙන් විස්තර කරන්න.

06.
1. සන්නිවේදනය යනු කුමක්ද? සරලව අර්ථ දක්වන්න.
2. සන්නිවේදනය පිළිබඳ ලැස්වෙල් අර්ථකථනය දක්වන්න.
3. ලැස්වෙල් "බලපෑම" යනුවෙන් අදහස් කලේ කුමක් දැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
4. සන්නිවේදනයේ ප්‍රධාන කාර්යයන් 4ක් විස්තර කරන්න.

07. ඡායාරූප ප්‍රදර්ශනයක් පැවැත්වීමට විද්‍යාලයීය ඡායාරූප සංගමය තීරණය කළේය.

1. ආංකිත ඡායාරූපකරණයේ වාසි 2ක් ලියන්න
2. ඡායාරූප වර්ග 2 ක් දක්වා කෙටියෙන් විස්තර කරන්න
3. ඡායාරූප ගැනීම සඳහා දළ සේයාපටලයක් තෝරා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 3ක් පැහැදිලි කරන්න.
4. ඡායාරූප ප්‍රදර්ශනය පිළිබඳ දැනුවත් කිරීමේදී පෝස්ටර් මාධ්‍යය යොදා ගැනීමේ වැදගත්කම කරුණු 4 දක්වමින් පැහැදිලි කරන්න.